# ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ අද්‍යතන ප්‍රවණතා

චන්ද්‍රසිරි බෝගමුව
නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

විසිඑක්වැනි සියවස ආරම්භයේ සිට ලංකාවේ ප්‍රසංග කලාවේ ශීඝ්‍ර වර්ධනයක් හා දියුණුවක් පෙන්නුම් කරයි. ගුවන්විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍යවල ව්‍යාප්තිය; පාසල්, විශ්වවිද්‍යාල, කලායතන, සංස්කෘතික මධ්‍යස්ථාන ආදියෙහි සංගීතය, නර්තනය, නාට්‍ය වැනි විෂයයන් ඉගැන්වීම හා ඉගෙනගැනීම වර්ධනයවීම; පරිගණක තාක්‍ෂණය, ඉලෙක්ට්‍රොනික සංගීත භාණ්ඩ භාවිතය, පටිගත කිරීමේ තාක්‍ෂණික පහසුකම් සුලබ වීම නිසා ගීත නිර්මාණ කාර්යය පහසුවීම; ක්‍ෂණිකව නිර්මාණය වන ගීත එෆ්.එම්. ගුවන්විදුලි නාලිකා රාශියකින් නිරතුරු ව ප්‍රචාරයවීම; සිරස, ස්වර්ණවාහිනී, දෙරණ, අයි.ටී.එන්, ජාතික රූපවාහිනිය වැනි රූපවාහිනී නාලිකා මගින් සුපර් ස්ටාර්, ඩාන්සින් ස්ටාර්, දෙරණ ලිට්ල් ස්ටාර්, දෙරණ ඩ්‍රීම් ස්ටාර්, සිටි ඔෆ් ඩාන්ස්, ශ්‍රී ලන්කන් ලයිෆ්, රංගාභිෂේකය, කොමඩි ස්ටාර්, ෂැඩෝ ස්ටාර්, මෙගා ස්ටාර් වැනි රියැලිටි වැඩසටහන් රාශියක් නිෂ්පාදනය වීම හා ඒවා පොදු ජන ආකර්ෂණය දිනා ගැනීම; රාජ්‍ය ආයතන හා පෞද්ගලික සංවිධාන විසින් පවත්වනු ලබන සංගීත, නර්තන, නාට්‍ය තරග වැඩි වීම; විවිධ අරමුණු සඳහා පවත්වන උත්සව අවස්ථාවන්හි ප්‍රාසංගික කලාංග ඉදිරිපත් කිරීම සුලබ වීම යන කරුණු මෙසේ ශ්‍රී ලංකාවේ ප්‍රසංග කලාවේ වර්ධනයට හේතු වී ඇත.

සංගීත, නර්තන හා නාට්‍ය සංකලනය වූ විවිධ ගණයේ ප්‍රසංග ඉදිරිපත් කිරීමේ දී දර්ශනීය පසුතල සහිත විශේෂ වේදිකා ඉදි කිරීම, පරිගණකගත රංගාලෝක සැලසුමකට අනුව ආලෝකය හැසිරවීම හා පාලනය, නවීන ශබ්ද සංයෝජන විධි, විශේෂ ශ්‍රව්‍ය-දෘශ්‍ය ප්‍රයෝග, වීඩියෝ තාක්‍ෂණ භාවිතය ආදිය විමසා බලන විට 20 වන සියවසේ අග භාගයට වඩා ප්‍රේක්‍ෂාව මැවීමෙහි හා ප්‍රේක්‍ෂක ආකර්ෂණය දිනා ගැනීමේ උපක්‍රමවල කැපීපෙනෙන දියුණුවක් විද්‍යමාන වේ.

විවිධ අරමුණු මුල් කර ගෙන ප්‍රසංග ඉදිරිපත් කෙරෙන හෙයින් සංඛ්‍යාත්මක වර්ධනයක් පෙන්නුම් කෙරේ. පුද්ගලික, සාමාජික, ජාතික හා රාජ්‍ය මට්ටමේ නොයෙක් උත්සව සංවිධානය වීම, එබඳු උත්සවවලට රැස්වන ජනතාව පිනවීමට ප්‍රාසංගික කලාංග ඉදිරිපත් කිරීම, ජීවත් වන කලාකරුවන් වෙනුවෙන් පැවැත්වෙන උපහාර උත්සව, මියගිය කලාකරුවන් අනුස්මරණය කිරීමේ උත්සව, ආධුනික ශිල්පීන්ගේ කලඑළි මංගල්‍ය, ගීත කැසට්පට හා සංයුක්ත තැටි නිකුත් කිරීම, ග්‍රන්ථ දොරට වැඩුම, ප්‍රවීණ සංගීත---නර්තන ශිල්පීන්ගේ නව නිර්මාණ එළි දැක්වීම, මැතිවරණ දේශපාලන ප්‍රචාරක කටයුතු, වෙළඳ සමාගම්වල අලෙවි ප්‍රවර්ධන කටයුතු, අරමුදල් තර කිරීමේ ව්‍යාපෘති, චිත්‍රපට/ටෙලි නාට්‍ය සම්මාන ප්‍රදානෝත්සව මෙන් ම සංචාරක හෝටල්, අවන්හල්, ආදිය ආශ්‍රිත ව ඉදිරිපත් වන නර්තන අංග, ගීතමය රැඟුම් හා නාට්‍යමය ජවනිකා සුලබ ව දැකගත හැකි ය.

යථෝක්ත ප්‍රසංග නිරීක්‍ෂණය කිරීමේ දී අප විසින් හඳුනා ගැනුණු ප්‍රවණතා කීපයක් මෙසේ ය.

- විදේශීය ප්‍රවීණ කලා ශිල්පීන්ගේ ගායන, වාදන, නර්තන ඉදිරිපත් කිරීම්.
- දේශීය නවක, ආධුනික, අර්ධ වෘත්තීය, ප්‍රවීණ, වෘත්තීය මට්ටමේ කලා ශිල්පීන්ගේ ඉදිරිපත් කිරීම්.
- අපේක්ෂිත අරමුණු අනුව ප්‍රාසංගික අංග තීරණය වීම.
- ප්‍රසංගවල ස්වභාවය අනුව ඊට සහභාගි වන ප්‍රේක්‍ෂක ජනගහනයේ ස්වරූපය වෙනස් වීම.
- ප්‍රසංග සංවිධානයේ අභිමතාර්ථ අනුව ශ්‍රාවක-ප්‍රේක්‍ෂක පිරිස අත්විඳින රසවින්දන මට්ටම අඩු වැඩි වීම.
- විචිත්‍ර ප්‍රේක්‍ෂාවන් මැවීමට නවීන තාක්‍ෂණික උපක්‍රම භාවිතය.

2004 ඔක්තෝබර් 04 දා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා වේදිකාවේ රඟ දැක්වුණු නට්ක්‍රැකර් නම් වූ රුසියානු බැලේ නාට්‍යයේ සිට 2010 සැප්තැම්බර් 18 දා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ එළිමහන් වේදිකාවක පැවැත්වුණු දීපිකා ප්‍රියදර්ශනීගේ 'සුදු හංසිනී' ඒකල සංගීත ප්‍රසංගය දක්වා අප විසින් නරඹන ලද සියයකට ආසන්න සංගීත ප්‍රසංග, නර්තන ප්‍රසංග, නාට්‍ය දර්ශන හා විවිධ ප්‍රසංග පාදක කරගෙන මෙම පර්යේෂණයට අදාළ කරුණු විමසා බලනු ලැබේ.